චක්‍රලේඛ අංක : 10/2017

සමුපකාර සේවක කොමිෂන් සභාව (බ:ප:),
අංක 109 , හතර වන මහල,
මහ වීදිය,
බත්තරමුල්ල.
2017.05.04

බස්නාහිර පළාතේ සියළුම විවිධ සේවා සමුපකාර සමිති,
දිස්ත්‍රික් ග්‍රාමීය බැංකු සංගම්, සණස සමිති, දිස්ත්‍රික් සමුපකාර මණ්ඩල සහ
අනෙකුත් සියලුම ලියාපදිංචි සමුපකාර සමිති සභාපතිවරුන් වෙත,

**<u>සණස සාමාන්‍යාධිකාරී III ශ්‍රේණිය - වැ:ප: 102:5</u>**

**සියලුම සණස** සමිති සඳහා සණස සාමාන්‍යාධිකාරී III ශ්‍රේණිය තනතුර ඇති කිරීමට කටයුතු කර ඇති අතර ඒ සඳහා පහත සඳහන් සුදුසුකම් අනුමත කරන බව කොමිෂන් සභාවේ නියමය පරිදි දන්වමි.

1) තනතුරේ නම : සණස සාමාන්‍යාධිකාරී III ශ්‍රේණිය
වැටුප් පරිමාණ අංකය : 102:5
අවම වයස් සීමාව : අවුරුදු 30
උපරිම වයස් සීමාව : අවුරුදු 45

**<u>තනතුර සඳහා අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්</u> :**

**(අ)** 102:06 වැ.ප. ස්ථිර තනතුරක වසර 05ක සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම හෝ 103:07 වැ:ප: ස්ථිර තනතුරක වසර 08ක සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම

**හෝ**

**(ආ)** පිළිගත් විශ්වවිද්‍යාලයක වාණිජවේදී උපාධියක් ලබාතිබීම සහ පිළිගත් ආයතනයක අදාල ක්ෂේත්‍රයේ වසර 01ක සේවා පළපුරුද්දක් ලබාතිබීම

**හෝ**

**(ඇ)** ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ අන්තර් මධ්‍ය සහතිකය ලබා තිබීම හෝ ශ්‍රී ලංකා ගණකාධිකාරී ශිල්පීය ආයතනය තෙවන වසර සමත්වීම හෝ උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමාවේ දෙවන වසර සමත්වීම හෝ සහ පිළිගත් ආයතනයක අදාල ක්ෂේත්‍රයේ වසර 03ක සේවා පළපුරුද්දක් ලබාතිබීම

එස්.ඒ.එල්.රංගනි,
ලේකම්,
සමුපකාර සේවක කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

**පිටපත් :**

I. ප්‍රධාන ලේකම්, බස්නාහිර පළාත.
II. ලේකම්, සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය, බස්නාහිර පළාත.
III. සමුපකාර සංවර්ධන කොමසාරිස්/සමිති රෙජිස්ට්‍රාර්, බස්නාහිර පළාත.
IV. සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (කොළඹ/ ගම්පහ/ කළුතර)
V. අධ්‍යක්ෂ, බස්නාහිර පළාත් සමුපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය.
VI. ලේකම්, මධ්‍යම රජයේ සමුපකාර සේවක කොමිෂන් සභාව.
VII. සියළුම පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා ලේකම්වරුන්.
VIII. සියළුම වෘත්තීය සමිති සංගම්